# නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය
# කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සහායක තනතුරෙහි III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයයි.

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සහායක තනතුරෙහි III ශ්‍රේණියේ පහත සඳහන් කාර්යයන්ට අදාල පුරප්පාඩු 78 ක් පිරවීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| **තනතුරට අදාල කාර්යය** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|
| සනීපාරක්ෂක කම්කරු | 25 |
| කම්කරු | 42 |
| උද්‍යාන කම්කරු | 10 |
| කෘෂි කම්කරු | 01 |

## බඳවා ගැනිමේ සුදුසුකම්

**01.**

1.1 අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස(සා.පෙ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙක (02 ) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත්වී තිබීම

1.2 වෘත්තීය සුදුසුකම් : තනතුරේ කාර්යයන්ට අදාලව වෘත්තීය සුදුසුකම් ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

1.3 පළපුරුද්ද : තනතුරේ කාර්යයන්ට අදාලව පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

1.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය

1.5 වෙනත් සුදුසුකම් :

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii. තනතුරට බඳවා ගැනිම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

1.6 වයස :

අවම සීමාව : අවු.18 ට නොඅඩු

උපරිම සීමාව : අවු.45 ට නොවැඩි

**02. බඳවා ගැනීමේ ක්‍රමය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදීම සුදුසුකම්ද පරීක්ෂා කරනු ලැබේ.

**2.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශිර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| වෘත්තීය සුදුසුකම් | 20 |
| තනතුරට අදාලව ලබා ඇති පළපුරුද්ද | 40 |
| බාහිර ක්‍රියාකාරකම් | 15 |
| සම්මුඛ පරීක්ෂයේදී දක්වන ලද කුසලතාවය | 05 |
| **එකතුව** | **100** |

**වැටුප් ක්‍රමය :**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 පරිදි,

කේත අංකය : PL – 1 – 2016

වැටුප් පරිමාණය : රු. 24250 – 10 x 250 – 10 x 270 – 10 x 300 – 12 x 330 – 36410/-

(රාජ්‍ය පරිපාලන 3/2016 චක්‍රලේඛයේ II උපලේඛණයට අනුව වැටුප් ගෙවනු ලැබේ.)

**03. අයදුම් කිරීමේ ක්‍රමය:**

මේ සමඟ ඇති ජීවදත්ත ඇතුළත් පෞද්ගලිකවම සකස් කරනු ලැබූ අයදුම්පත්‍ර 2017.10.28 දිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, තැ.පෙ. 557, ඕල්කට් මාවත, කොළඹ - 10 " ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කළයුතුය. අයදුම්පත්‍ර එවනු ලබන කවරයේ වම්පස ඉහළින් "කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සහායක තනතුර " ලෙසට සටහන් කළයුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර සලකා බලනු නොලැබේ.

දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු /නීතීඥවරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු හෝ රු. 41,500/- ක මාසික ඒකාබද්ධ වැටුපක් (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 I උපලේඛනය අනුව) ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ. තැපැල් මාර්ගයෙන් එවීමේදී සිදුවන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල්වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කිරීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ. නියමිත සුදුසුකම් සපුරා නැති අයදුම්පත් සහ නියමාකාරයෙන් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ

**04. රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිම :-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014(iv) අනුව ප්‍රාථමික ගණයේ සියළුම නිලධරයන් සඳහා අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතා මට්ටම වන 4 වන කණ්ඩයට යටත්වීම අවශ්‍ය නොවන අතර ඒ සඳහා ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය මඟ පෙන්වීම මත සකස් කරනු ලැබූ විෂය නිර්දේශය අනුව පවත්වනු ලබන පැය 50ක භාෂා කුසලතා වර්ධනය සඳහා වන පාඨමාලාවක් සඳහා සහභාගීත්වය පමණක් ප්‍රමාණවත් වේ.

**05. සාවද්‍ය තොරතුරු සැපයීම :-**

ඔබ විසින් එවන ලද අයදුම්පත්යේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරු බඳවා ගැනීමෙන් පසුව

අනාවරණය වුවහොත් ඊට අදාල ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**06. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි : -**

i. මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

ii. නියම කරනු ලබන පරිදි මෙම දෙපාර්තමේන්තුවට අයත් ඕනෑම තාක්ෂණ / කාර්මික විද්‍යාලයක වුවද සේවය කිරීමට හැකි විය යුතුය.

iii. තෝරාගනු ලබන අපේක්ෂකයන් තනතුරට අදාල බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානවලටද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද මුදල් රෙගුලාසිවලටද රජය හෝ රේඛීය අමාත්‍යාංශය හෝ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබන නීති හා රෙගුලාසිවලටද යටත් විය යුතුය.

**07.** පුරප්පාඩුවලින් කොටසක් හෝ සියල්ලම හෝ පිරවීමේ අයිතිය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

**08**. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

පී.එන්.කේ. මලලසේකර
අධ්‍යක්ෂ ජනරාල්

2017.09. 28 දින
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
කොළඹ - 10